# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2343/62 - 2023 අගෝස්තු මස 05 වැනි සෙනසුරාදා - 2023.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත**

**(460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : MON/WEL/LND/16/05/02/202/01.

ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4/3/8/2019/CEB/613.

විදුලිය සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ උපකාරක ව්‍යාපෘතිය (SESRIP-Package 04) යටතේ යෝජිත වැල්ලවාය ද.වෝ. 33 අධිසැර විදුලිය බෙදාහැරීමේ මධ්‍යස්ථානය (ගැන්ට්‍රි උපපොළ) ඉදි කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිඹුලමුරේ ගමේ පිහිටි, මොණරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙළ කර ඇති, කැඩැස්තර සිතියම් අංක 720284 හි කලාප අංක 01 හි පත්‍ර අංක 01 හි දැක්වෙන ඉඩම.

01. කැබලි අංකය 01

ඉඩමේ නම : දිඹුලමුරේකුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ශිරාන් වසන්ත සමරකෝන් විජේසිංහ සහ රවීන්ද්‍ර අතුල සමරකෝන් විජේසිංහ, ඇල්ල පාර, වැල්ලවාය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0182

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් 2023 ඔක්තෝබර් මස 13 වැනි දින පෙ.ව. 10.00ට වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. එච්. කේ. ඒ. නිශාන්ත,**
ප්‍රාදේශීය ලේකම් (*වැ. බ.*),
වැල්ලවාය.

2023 ජූලි මස 28 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0059